# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

# කොළඹ

## ඉන්දියාව ටොන් 10ක බෙහෙත් තොගයක් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරයි

මේ වන විට පවතින කොවිඩ්-19 අර්බුදය හමුවේ අද දින ඉන්දියාව විසින් ජීවිත සුරකින අත්‍යාවශ්‍ය බෙහෙත් ටොන් 10ක තොගයක් ශ්‍රී ලංකා රජය වෙත පරිත්‍යාග කෙරිණ. මෙම බෙහෙත් ශ්‍රී ලංකා රජය විසින් ඉල්ලුම් කර තිබිණ. එයා ඉන්ඩියා සමාගමේ විශේෂ ගුවන්යානා දෙකක් මගින් එම බෙහෙත් තොගය අද දින ශ්‍රී ලංකාවට රැගෙන එන ලදී.

2. මෙය යහපත් සහ අසීරු කාල වලදී ශ්‍රී ලංකාව සමඟ රැඳී සිටීමට ඉන්දියාවේ දැඩි කැපවීම පිළිඹිබු කරන තවත් අවස්ථාවකි. දේශීය වශයෙන් පවතින අභියෝග සහ සීමාවන් හමුවේ වුවද සිය සම්පත් සහ ප්‍රවීණත්වය තම මිතුරන් සහ සහකරුවන් සමඟ බෙදාහදා ගත යුතු බව ඉන්දියාව සැමවිටම විශ්වාස කරයි.

3. කොවිඩ්-19 වසංගතයට එරෙහිව ගත හැකි පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඉන්දියානු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ මූලිකත්වයෙන් 2020 මාර්තු මස 15 වන දින සාක් නායක සමුළුවක් වීඩියෝ තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. එහිදී සාක් සංවිධානයේ කොවිඩ්-19 හදිසි අරමුදල සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 10ක් ලබා දීමටද ඉන්දියාව පොරොන්දු විය. ඉන් අනතුරුව 2020 මාර්තු 26 වන දින සාක් රටවල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් වීඩියෝ තාක්ෂණය ඔස්සේ සමුළුවකට සහභාගී වූහ. ඉන්දියාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය සාක් රටවල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට අන්තර්ජාලය හරහා පුහුණු සැසි පැවැත්වීමේ වැඩපිළිවෙළක්ද ආරම්භ කර ඇත. ගුජරාටයේ ගාන්ධිනගර් හි පිහිටා ඇති සාක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයද සාක් සංවිධානයේ සාමාජික රටවල කොවිඩ්-19 රෝගයට අදාළ තත්වය පිළිබඳ දැක්වෙන වෙබ් පිටුවක් [http://www.covid19-sdmc.org/] ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාව මෙම සියලු වැඩපිළිවෙළවල් හි වටිනා සාමාජිකයකු බවට පත්ව ඇත.

2020 අප්‍රේල් 07

කොළඹ

*****